පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය- 79

ආයතනයේ නම - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ.

පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் -79

நிறுவனத்தின் பெயர-மாவட்ட செயலகம் மாத்தளை

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) ன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No –79

Name of the Institution – District Secretariat, Matale

Submission of observations of the Hon' minister in charge of the instituions and Steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119(4)

කාරක සභාව විසින් හඳුනාගන්නා ලද අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කරගැනීම සඳහා ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
01.ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	රජයේ කාර්යාලයක පවත්වාගෙන යායුතු ලේඛන 21 ක් පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ගණකාධිකාරීවරුන් හා විෂය ලිපිකරුවන් කැඳවා උපදෙස් ලබා දී ඇති අතර, මේ වන විට සියළුම කාර්යාලවල ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර ඇත. මේ පිළිබඳව විගණන කළමනාකරණ කමිටුවේදී ප්‍රගතිය සමාලෝචනයට ලක් කෙරේ.
02.අනවසර අල්ලා ගැනීම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	විගණන විමසුමට ලක් වූ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනවසර අල්ලා ගැනීම් ලේඛනය මේ වන විට යාවත්කාලීන කොට ඇති අතර , මාතලේ දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලද අනවසර අල්ලා ගැනීම් ලේඛන යාවත්කාලීන කොට පවත්වාගෙන යනු ලබයි.
03.මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.	මාතලේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව 2022 වර්ෂයේ පෙබරවාරි මස 02 හා සැප්තැම්බර් මස 28 යන දෙදින තුළ පවත්වා ඇති අතර, අනෙකුත් මාසවල එකල පැවැති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් මෙම කමිටුව පැවැත්වීමට නොහැකි වී ඇත. එම වර්ෂයේ ඔක්තෝම්බර් සිට දෙසැම්බර් දක්වා කාලවකවානුව තුළ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක HA/DEVP/pro/General/2017-03-DCC-Voll iv හා 2022.09.07 වන දිනැති ලිපියෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ගේ හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ගේ පත්වීම් අහෝසි කර, නැවත නව සභාපතිවරුන් පත් කිරීමෙන් පසුව මෙම කමිටු පවත්වන ලෙස උපදෙස් ලබා දී ඇති හෙයින් පවත්වා නොමැත. 2023 වර්ෂයේදී ජනවාරි හා මාර්තු මාසවල එවකට රටේ පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වය හේතුවෙන්ද, ජුලි සහ සැප්තැම්බර් මාස වල පිළිවෙලින් සාකච්ඡා කිරීමට කරුණු නොමැති වීම හා සම්බන්ධීකරණ කමිටු සභාපතිහට කාර්ය බහුලත්වය හේතුවෙන් රැස්වීම පැවැත්වීමට දිනයක් යොදා ගැනීමට නොහැකිවීම හේතුවෙන් නොපැවැත් වූ අතර, 2023 දෙසැම්බර් මස ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික්

	සම්බන්ධීකරණ කමිටුව පවත්වා ඇත. 2024 වර්ෂයේදී මාර්තු, අප්‍රේල්, මැයි යන මාස වල විධායක නිලධාරීන්ගේ වැඩවර්ජන හේතුවෙන් රැස්වීම් පැවැත්වීමට නොහැකි වී ඇති අතර, අගෝස්තු මාසය දක්වා මසකට වරක් බැගින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පවත්වා ඇත.
04.දිස්ත්‍රික් ලේකම් විසින් කැඳවනු ලබන ප්‍රාදේශීය ලේකම් සමුළුව මාසිකව පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ උද්ගතව පැවති අනිශය සීමාකාරී වූ මූල්‍ය අවකාශය තුළ රාජ්‍ය ව්‍යයම් කළමනාකරණය සම්බන්ධයෙන් නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022, 08/2022, 09/2022 හා ජනාධිපති ලේකම්වරයා විසින් නිකුත් කරන ලද , PS/SB/Circular/10/2022 හා 2022.08.15 වන දිනැති චක්‍රලේඛ උපදෙස් අනුව රාජ්‍ය ආයතන විසින් විවිධ උත්සව ආදිය නොපැවැත්විය යුතු බවට දැඩිව අවධාරණය කර තිබූ අතර, මේ හේතුවෙන් කොවිඩ්-19 මර්දනයේ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සමුළු නොපැවැත් වූ අතර, බොහෝවිට ඊ-මේල්, Whatsapp හා zoom තාක්ෂණය ඔස්සේ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීමේ කටයුතු ව්‍යවස්ථා දැරීමකින් තොරව සිදු කළ අතර, අත්‍යවශ්‍යම රාජකාරී වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවැත්වෙන රැස්වීම් වලදී බොහෝවිට මෙම නිලධාරීන් දැනුවත් කිරීම සිදු කරනු ලැබුණි.
05.දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස් වී නොපැවතුණි.	දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව වර්ෂයේ ප්‍රධාන වගා කන්න දෙක සඳහා රැස්වෙනු ලබන අතර 2023 වර්ෂයේදීද ප්‍රධාන වගා කන්න දෙක සඳහා 2023.02.07 මහකන්නය සඳහාද 2023.09.20 යල කන්නය සඳහාද වන ලෙස මෙම රැස්වීම් පවත්වා ඇති අතර,මෙම වසරේදීද අගෝස්තු මස 16 වන දින දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව පවත්වා ඇත.
06.දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව මාසිකව රැස් වී නොතිබුණි.	දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව වර්ෂයේ මූල් භාගයේ සහ අවසන් භාගයේ වශයෙන් වසරකට දෙවරක් පැවැත්වෙන අතර, 2023 වර්ෂයේ එම රැස්වීම් විධිමත් පරිදි පවත්වා ඇත.
07.සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම්ගතව නොතිබුණි.	2022 වර්ෂයේ කාර්යය මණ්ඩලයේ සියළුම නිලධාරීන් වෙනුවෙන් කාර්යය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම්ගත වී ඇති අතර 2023 වර්ෂයේ සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක අනුව

	කටයුතු කර ඇත.
08.මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද, ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වශයෙන් අතිරේක දිස්ත්‍රික් ලේකම් වරයා 2020 වර්ෂයේ සිට නම්කර රාජකාරි පැවරීම සිදුකර ඇත. ඒ අනුව වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කරනු ලබයි.
09.දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට එක බැගින් රැස් වී නොතිබුණි.	2023 වර්ෂයේ පැවති මූල්‍ය තත්ත්වය මත මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුව පැවැත්වීම උදෙසා අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීමේ අපහසුතාවයක් පැවැති අතර, රාජ්‍ය නිලධාරීන් නිරන්තරයෙන් රැස්වීම් සඳහා කැඳවීමට අපහසුවීමත් හේතුවෙන් රැස්වීම් කිහිපයක් එකම දිනයන්හිදී පැවැත්වීම සිදු කරන ලදි. 2023 වර්ෂයේ තුන්වන කාර්තුවේ ළමා කමිටු පවත්වන ලද අවස්ථාවේදී මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුව ස්ථාපිත කරන ලද අතර 4 වන කාර්තුවේදී ළමා කමිටුවේදී සාකච්ඡා කිරීමට කරුණු රැසක් පැවතීම හේතුවෙන් මෙම කමිටුව රැස්වීමට නොහැකි වූ අතර, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සහය ඇතිව අවසන් කාර්තුවේ මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුව පැවැත්වීමට කටයුතු සිදුකර ඇත.
10.සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී නිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2022 වසරේ සැලසුම් කරන ලද පුහුණු අවස්ථා ගණන 22ක් වන අතර, පැවැත් වූ පුහුණු අවස්ථා 16කි.මේ අනුව පුහුණු අවස්ථා පිළිබඳ ප්‍රතිශතය 72.7%කි. එහෙත් එම වසරේ සැලසුම් කරන ලද පුහුණු වැඩමුළු ගණන 35ක් වන අතර, පැවැත් වූ පුහුණු වැඩමුළු ගණන 16කි. ඒ අනුව ප්‍රතිශතය 45.71%ක් වේ. 2022 වර්ෂයට සැලසුම්කරන ලද පුහුණු වැඩසටහන් සඳහා ඇස්තමේන්තුගත මුදල රු.1,725,805.00 ක් වන අතර ඒ සඳහා රු.500,000.00 ප්‍රතිපාදන වෙන්විය. ඒ අනුව ඇස්තමේන්තු කරන ලද ප්‍රතිපාදන වලින් ලැබී ඇත්තේ 28.97% ක් පමණි. මේ සම්බන්ධයෙන් අමතර ප්‍රතිපාදන ඉල්ලුම් කරනු ලැබුවත් ප්‍රතිපාදන සීමිත බැවින් එම ප්‍රතිපාදන ලබාගත නොහැකි විය.
11.උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	ඉංජිනේරු සේවයට අයත් නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සිදු කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන , ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන්ය.

12.දිස්ත්‍රික් පරිසර කමිටු අවම වශයෙන් මාස 02කට වරක් රැස් වී නොතිබුණි.	දිස්ත්‍රික් පරිසර කමිටුව පැවැත්වීම මහජනතාවගෙන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් පරිසර ගැටළු සම්බන්ධයෙන් ලැබෙන ලිපි ප්‍රමාණය මත සිදු කරනු ලබයි. මීට අමතරව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු හා ඉඩම් පරිහරණ කමිටු මගින් පරිසර ගැටළු සාකච්ඡා කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව එම වසරේ රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් ලබා දී ඇති උපදෙස් අනුව රැස්වීම් දෙකක් පමණක් පවත්වා ඇත

තේජානි තිලකරත්න,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
මාතලේ.

තේජානි තිලකරත්න
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
මාතලේ.

පී.ඩබ්.එස්.කේ.විජේසිංහ,
ප්‍රධාන ගණකාධිකාරී,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මාතලේ.

පී.ඩබ්.එස්.කේ. විජේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මාතලේ.